අඩ්ඩාලච්චේනයි ප්‍රාදේශීය සභාව
අම්පාර දිස්ත්‍රික්කය

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 12 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 22 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට අඩ්ඩාලච්චේනයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2017 හා 2018 වර්ෂවල පරිත්‍යාග වශයෙන් ලැබුණු පුස්තකාල පොත් 107 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්වල ගැලපීම් කළ යුතු වේ. | පරිත්‍යාග වශයෙන් ලැබුණු පොත්වල වටිනාකම තක්සේරු කර 2020 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී වත්කමක් වශයෙන් පෙන්වීමට කටයුතු කරමි. |
| (ii) | 2015 සිට 2018 වර්ෂය දක්වා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශය අනුව ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ විනාශකරන ලද පුස්තකාල පොත් 780 ක වටිනාකම හා 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශය අනුව සමාලෝචිත වර්ෂයේ විනාශකරන ලද වර්ග 11 ක භාණ්ඩ 24 ක වටිනාකම ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි. | ගිණුම්වල ගැලපීම් කළ යුතු වේ. | උක්ත කරුණු සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශය අනුව ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ විනාශ කරන ලද පොත්වල වටිනාකම හා භාණ්ඩ 24 ක වටිනාකම 2020 වර්ෂයේ අවසන් ගිණුම්වල ගැලපීම් කරමි. |

(ආ) **ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වීථි පහන් විදුලි පරිභෝජනය සම්බන්ධයෙන් ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවිය යුතු රු.316,421 ක් සහ ලංකා විදුලි බල මණ්ඩලයෙන් අයකළ යුතු මුදල රු.350,321 ක් ගෙවීමට සහ අයකිරීමට කටයුතු නොකර වර්ෂ 24 කට වැඩි කාලයක් ගිණුම්වල පෙන්වමින් තිබුණි. | අදාල ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවේ තීරණය අනුව මෙම ගැටළු සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගෙන විදුලි බල මණ්ඩලයෙන් සභාවට ගෙවීය යුතු හා අයවිය යුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

(ඇ) **නොසැසඳුණු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 වර්ෂය අවසානයට අනිකුත් හිඟ අදායම් ප්‍ර.ස-07 වාර්තාව අනුව රු.10,523,528 ක් වුවද, අදායම් වියදම් ගිණුම අනුව රු.373,457 ක් වූයෙන් රු.10,150,071 ක නොසැසඳීමක් විය. | අදාල නොසැසඳීම ගැලපීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ii) | ඝන අපද්‍රව්‍ය සේවා හිඟ ගාස්තු ගිණුම්වල දක්වා ඇති ශේෂය හා උපලේඛන අතර රු.742,802 ක වෙනසක් විය. | ගිණුමේ හා උපලේඛන ශේෂ සමාන විය යුතු වේ. | සභාව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛන අනුව ඝණ අපද්‍රව්‍ය ගාස්තු ශේෂය අවසන් ගිණුම්වල දක්වා ඇත. |

(ඇ) **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස දැක්වීම |
|---|---|---|
| රු.2,377,155 ක් වටිනා ගිණුම් විෂයන් 06 කට අදාල ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය අයිතිය තහවුරු කිරීමේ ලේඛනය, ශේෂ තහවුරු කිරීමේ ලේඛන සහ සමීක්ෂණ වාර්තා යන සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටු දායක ලෙස සන්නිරීක්ෂණ කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ ගිණුම් ශේෂ සනාථ කිරීම් සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරි කාල වලදි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

-------------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) | | | |
| (i) රීති15 | ඉඩම් ගනුදෙනු සම්බන්ධ මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් රෙජිස්ටාර් ජෙනරාල්වරයාට එක් එක් කාර්තු අවසානයේදී යැවීමට කටයුතු නොකර එක් එක් වර්ෂ අවසානයේදී ඉදිරිපත් කර තිබුණි. | අදාල රීති අනුව කටයුතු කළ යුතු වේ. | කාර්තුවට වරක් ඉඩම් රෙජිස්ටාර් ජනරාල් වරයාගෙන් ලබා ගෙන ප්‍රතිපූර්ණ කිරීමට කටයුතු කරන්නෙමි. |
| (ii) රීති 217 | සභාවට අයත් සියළුම ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍ර.ස.- 46 ආකෘතිය අනුව ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | සභාවට අයත් ඉඩම් සහ ගොඩනැගිලි ලෙඛන ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සටහන් කිරීමට කටයුතු කරමි. |
| (ආ) 2000 අංක 53 සහ 1988 අංක 56 යන පනත්වලින් සංශෝධිත 1988 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ ක්‍රියාත්මක කළ රෙගුලාසි අනුව නිකුත් කරන ලද 2008 ජනවාරි 25 දිනැති සහ 1523/16 අංක දරන අතිවිශේෂ ගැසට්පත්‍ර දැන්වීම | පාරිසරික බලපත්‍රයේ වලංගු කාලය ඉක්මවූ ව්‍යාපාර ස්ථාන 16 ක් සඳහා නව බලපත්‍ර ලබා දීමට කටයුතු කර නොතිබුණි. තවද, බල ප්‍රදේශයේ ඇති නව වෙළඳ ස්ථාන හඳුනා ගැනීම සහ සමීක්ෂණ පවත්වා නොතිබුණි. | අදාල බලපත්‍ර ලබා දීමට කටයුතු කළ යුතු අතර නව ව්‍යාපාර ස්ථාන හඳුනා ගැනීම සඳහා සමීක්ෂණ පවත්විය යුතු වේ. | ව්‍යාපාර කිහිපයක් අත්හැර දමා ඇති අතර, අනිකුත් ක්‍රියාත්මක වන ව්‍යාපාර සඳහා පාරිසරික බලපත්‍ර අළුත් කිරීමට කටයුතු කර ඇති අතර, මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයා විසින් පරීක්ෂණ පවත්වා අළුත්වැඩියා කිරීම් සිදුකළ යුතු ස්ථාන සඳහා බලපත්‍ර නිකුත්කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී මුදල් රෙගුලාසි 571 | වසර දෙක ඉක්ම වූ රු1,537,614 ක් වටිනා තැන්පත් 63 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදාල කල් ඉකුත් වූ තැන්පත් නැවත ගෙවීම සඳහා අදාල අය වෙත දැනුවත් කරන ලදී, තවද ප්‍රසිද්ධ දැන්වීම්ද පළ කරන ලදී. ගෙවීම් ලබා නොගන්නා අවස්ථාවලදී අදාල තැන්පත් නිසිපරිදි සභාවේ ආදායමට මාරු කිරීමට කටයුතු කර ඇත. |

### 1.4.2 බදු අවශ්‍යතාවයට අනුකූල නොවීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1993 වර්ෂයේදී අයකර ගන්නා ලද පිරිවැටුම් බදු රු.7,390 ක් සහ 2000 වර්ෂයට පෙර අයකරන ලද වැට් බදු රු.14,270 ක් ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. | අදාල බදු නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිරිවැටුම් බදු දිගටම පවත්වා ගෙන යන බැවින් ලියවිලි වල අඩුපාඩු හේතුවෙන් අදාල බදු සම්බන්ධව කටයුතු කර නොහැකිව ඇත. 2020 වර්ෂයේ ගිණුම් සකස්කිරීමේදී මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,566,223 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,070,458 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 803,000 | 361,741 | 361,741 | -- | 733,000 | 271,375 | 271,375 | -- |
| කුලී | 2,600,000 | 2,368,950 | 2,368,950 | 273,000 | 1,950,000 | 1,902,253 | 1,902,254 | 273,000 |
| බලපත්‍ර ගාස්තු | 1,405,000 | 1,094,610 | 1,094,610 | -- | 2,105,000 | 748,000 | 748,000 | -- |
| වෙනත් ආදායම් | 28,455,000 | 23,234,963 | 26,948,812 | 14,501,340 | 26,562,000 | 27,008,322 | 16,530,970 | 18,217,591 |
| | 33,263,000 | 27,060,264 | 30,774,113 | 14,774,340 | 31,350,000 | 29,929,950 | 19,452,599 | 18,490,591 |

### 2.2.2 වෙළඳ බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී වෙළඳ ආයතන 529 කින් බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වෙළඳ ස්ථානය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තුව නියමිත කාලවලදී අයකර ගැනිමට කටයුතු කර යුතු වේ. | උක්ත කරුණු සම්බන්ධයෙන් 2019 මුදල් වර්ෂයේ අනුමත කර තිබූ ආදායම් පරීක්ෂක තනතුරු 02 ක් පුරප්පාඩුව පැවතුනු බැවින් අදාල මුදල් වර්ෂයේ අයවීම් සම්බන්ධයෙන් විවිධ ගැටළුවලට මුහුද දීමට සිදුවූ බැවින් සම්පූර්ණ ආදායම් රැස්කර ගැනීමට නොහැකි වූවද, දැනට හිඟ මුදලද අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

### 2.2.3 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනිකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.6,888,254 ක උසාවි දඩ මුදල් ලැබිය යුතුව ඇත. | නියමිත කාලවලදි අයකර ගැනීමට කටයුතු කර යුතු වේ. | උක්ත කරුණු සම්බන්ධයෙන් ලැබියුතු මුද්දර ගාස්තු සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර හිඟ මුදලින් රු.563,112 ක් අයකර ගෙන තිබුණු අතර, ඉතිරි හිඟ මුදල් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන තිබුණි. |

### 2.2.4 කුලිය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට හිඟ බදු කුලි වූ රු.380,800 ක් සමාලෝචිත වර්ෂයේදී අයකර නොතිබුණි. | අදාල කාලවලදි නිරවුල් කළ යුතු වේ. | අදාල පුද්ගලයන් රට හැර ගොස් ඇති බැවින් ඔවුන්ට එරෙහිව නඩු පැවරීමට නොහැකිව ඇත. |

### 2.2.5 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කරෙරතිවු ප්‍රාදේශීය සභාවෙන් අයවිය යුතු ඝණ අපද්‍රව්‍ය ඉඩම්වලට පස් පිරවීමේ ගාස්තු හිඟ මුදල් රු.1,712,948 ක් වර්ෂ 03 කට වඩා අධික කාලයක් ගත වී තිබුණ ද අයකර ගෙන නොතිබුණි. | හිඟ අයකිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | ඉකුත් වර්ෂයේ පළාත් පාලන කොමසාරිස්ගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ ලේකම් ඇතුළුව පවත්වන ලද රැස්වීමේදි අදාල හිඟ මුදල ගෙවීමට පොරොන්දු වූ බවත්, ඒ අනුව කොටස් මුදලක් වශයෙන් රු.500,000 ක් මෙම වසරේදී ගෙවා තිබුණි. ඉතිරිය කොටස් වශයෙන් ගෙවන බවට පොරොන්දු විය. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විවරණය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් 126 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභාවේ ආදායම් විධිමත් කිරීමට ප්‍රධාන කාරණා 13 ක් සඳහා අතුරු ව්‍යවස්ථා සකස්කර ක්‍රියාත්මක කළයුතුය. කෙසේ වුවද, සභාව විසින් 2012 වර්ෂයේ අතුරු ව්‍යවස්ථා 05 ක් සඳහා යෝජනා පිළියෙල කර තිබුණද, ඒවා අනුමත කර ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා 07 ක් අනුමැතිය සඳහා අදාල කාලයතුල පළාත් සභාවට යවා තිබුණි. අතුරු ව්‍යවස්ථා 05 ්ක පරික්ෂා කර ලියවිලි පිළියෙල කර 2019.05.23 වන දිනැති 2019/219 අංක දරන සභා තිරණය සමග පළාත් සභාව වෙත යවා ඇත. අනුමැතිය ලබා ගෙන ගැසට් පත්‍රයේ පළකිරීමෙන් අනතුරුව ක්‍රියාත්මක කරනු ලැබේ. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරි සැලස්මක් පිළියෙලකර නොතිබුණි. | වාර්ෂික ක්රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | උක්ත කරුණු සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවට පළාත් සභාවේ අනුමැතිය ලැබුණු විගස වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරමි. |

(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| i. තිරසර සංවර්ධනය මැනීම සඳහා දර්ශක කිරීම හඳුනාගෙන නොතිබුණි. | දර්ශක ඇති කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| ii. තිරසාර සංවර්ධන අරමුණ කරා ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන අයවැය මඟින් සලසා ගෙන නොතිබුණි. | මුදල් ප්‍රතිපාදන හඳුනාගෙන මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම් කළ යුතු වේ. | තිරසාර සංවර්ධන අරමුණ ලඟා කර ගැනීම සඳහා 2020 මුදල් වර්ෂයට අයවැය ලේඛන සකස්කිරීමේදි දරිද්‍රතාවය අඩුකිරීම සඳහා මහජන ජීවනෝපාය ඉහළ නැංවීම සඳහා රු.6,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කාර්යාල ගොඩනැගිල්ල, මහජන පුස්තකාල, මහජන පොල, මහජන ක්‍රිඩාංගනය, පොදු ලිං, ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය සහ සත්ව ඝාතනාගාර යන ස්ථාන පිහිටුවා තිබූ ඉඩම් 33 ක් තිබුණද, ඉන් ඉඩම් 26 ක් සභාවේ නමට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | උක්ත කරුණු සම්බන්ධයෙන් සභාව විසින් සලකුණු කර ඔප්පු ලබා නොගත් ඉඩම් සඳහා ඔප්පු ලබා ගැනීමට කටයුතු කරමින් පවති. |
| (ආ) | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහ වෙනත් සංවිධානවලින් ලබා ගෙන සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන 07 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවේ නමට අයිතිය පවරා නොතිබූ වාහන සම්බන්ධයෙන් අයතිය මාරු කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තනතුරු 06 කට අයත් සේවක පුරප්පාඩු 07 ක් විය. තවද, ලේකම් තනතුර 2017 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුනි. JCB යන්ත්‍ර ක්‍රියාකරු තනතුර ද ඉකුත් වර්ෂ හතරක සිට පුරප්පාඩුවී තිබුණි. | අදාල පුරප්පාඩු අවශ්‍යතාවය අනුව සම්පූර්ණ කරවා ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | උක්ත කරුණු සම්බන්ධයෙන් සේවක සංඛ්‍යා වාර්තා මාසික නැගෙනහිර පළාත් සභාවට යවනු ලැබේ. මේ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් සභාව විසින් කටයුතු කරනු ලැබේ. |
| (ආ) | නිලධාරින් 08 දෙනෙකුගෙන් අයවිය යුතු 2015 වර්ෂයේ සිට පැවත එන රු.182,441 ක හිඟ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | දැනට සේවයේ නියුතු නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ අදාල දෙපාර්තමේන්තුවලින් අයකර ගැනීමට කටයුතු කරන අතර, අනිකුත් නිලධාරීන්ගේ ණය ශේෂය ඇප කරුවන්ගෙන් සහ මරණ පාරිතෝෂිතයන්ගෙන් අයකර ගැනිමට කටයුතු කරමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු ට්‍රක්ටර් රථයක්, වතුරු බව්සරයක්, යතුරු පැදි 02 ක් සහ Single Drum Vibrator යන්ත්‍රයක්, ධාවනයෙන් ඉවත්කර ගාල්කර තිබුණි. | අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | අලුත්වැඩියා සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ වාර්තාව ලබා ගෙන ඒ අනුව කටයුතු කරමි. |

### 3.4.2 නිෂ්ක්‍රිය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාය යටතේ ලබා දී තිබූ රු.1,400,000 ක් යොදවා පල්ලක්කාඩු ග්‍රාමයේ ඉදිකර තිබූ සත්ව කටු ඇඹරුම් කර්මාන්ත ශාලාව සහ ඒ සඳහා මිලදී ගෙන තිබූ යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනිමට කටයුතු කර නොතිබුණි. | ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | කටු ඇඹරුම් යන්ත්‍රය ක්‍රියා කිරීම සඳහා III Phase line විදුලිය අවශ්‍යා වූ හෙයින් යන්ත්‍රය ක්‍රියා නොකර තිබුණි. දැනට III Phase line විදුලි සම්බන්ධතාව ලැබී ඇති බැවින් හැකි ඉක්මනින් මෙය ක්‍රියාත්මක කිරීමට කටයතු කරන බව දන්වා සිටිමි. |

## 3.5 ප්‍රසම්පාදන

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ජාතික ප්‍රසම්පාදන මාර්ගෝදේශයේ 4.2.1 වගන්තිය අනුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2006 මාර්තු 24 වන දින අංක 128 දරන චක්‍රලේඛ අනුව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් හා පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම නියමිත පරිදි පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි මුදල් වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම නියමිත පරිදි පිළියෙල කරනු ලැබේ. |

### 3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන අත්පොත 2.8.1(අ) අනුව ප්‍රසම්පාදන කටයුතු සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පිහිටුවා ගත යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා තාක්ෂණික ඇගයීම් වාර්තා නොමැතිව රු.2,536,557 ක ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි. | ප්‍රසම්පාදන අත්පොත අනුව කටයුතු කළ යුතු වේ. | අදාල නිලධාරීන් මාරුවී ගොස් ඇතත්, ඒ සඳහා නිලධාරීන් පත්කර නොතිබුණි. කෙසේවුවද, දැනට 2020 මුදල් වර්ෂය සඳහා අදාල පරිදි තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත්කර ඇත. |

## 4 ගිණුම් ගතයුතු භාවය සහ යහපාලන

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු වේ. | සේවක හිඟය හේතුවෙන් අපගේ කාර්යාලයේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට නොහැකිවී ඇතත් දැනට අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවීමට කටයුතු කර ඇත. |

### 4.2 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණයන්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2005 වර්ෂයේ අස්ථාන ගතවූ රු. 96,392 ක් වටිනා විදුලි භාණ්ඩ තොගය සහ 2014 වර්ෂයේ රු. 170,000 කට මිලදී ගෙන තිබූ solar power විදුලි බුබුළු 02 ක් 2015 දෙසැම්බර් 20 වන දින සොරකම් කිරීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 අනුව කටයුතු කළ යුතු වේ. | 2005 වර්ෂයේ ගබඩා ලේඛනයේ රු. 96,392 වටිනා විදුලි තොග දිගටම පෙන්වා තිබුණි. එයට අදාල ලියවිලි කිසිවක් නොතිබුණි. තවද, 2014 වර්ෂයේ මිලදී ගෙන සවි කර තිබූ සෝලා විදුලි බුබුළු 02 ක් සොරකම් කිරීම් සම්බන්ධයෙන් පොලිසියේ පැමිණිලි කර ඇත. |
| (ආ) | 2017 දෙසැම්බර් 31 දිනට මස් කඩ බදු කුලි රු. 273,300 ක් වර්ෂ හයක් පුරා අයනොවී පැවතුනි. | හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර යුතු වේ. | මස් කඩ අයිතිකරුවන්ට දැනුම් දී ඇත. අදාල පුද්ගලයන් රට හැර ගොස් ඇති බැවින්, ඔවුන්ට එරෙහිව නඩු පැවරීමට නොහැකිවී ඇත. |